Lesson 31

## ඔයා නිදා ගෙනද හිටියේ ?

Were you sleeping ?

(යම් ක්‍රියාවක් ) කරමින්ද හිටියේ ?

මීලගට අපි ඉගෙන ගන්න යන්නෙ අතීත කාලයේ කරමින් සිටි ක්‍රියාවල ප්‍රශ්න ස්වරූපය ගැන . ඒ කියන්නේ යම් ක්‍රියාවක් කරමින්ද හිටියේ ? කියන ප්‍රශ්නය අහන හැටි. එවැනි ක්‍රියා වල ප්‍රශ්න රූපය හැදෙන්නේ හරිම ලේසි ක්‍රමයකට .

- වාක්‍යයේ ආධාරක පදය , ඒ කියන්නේ was හෝ were වාක්‍යයේ මුලට එනවා

| | | |
|---|---|---|
| They were playing cards<br>දේ ව(ර්) ප්ලේයිං කාඩ්ස්<br>ඔවුන් කාඩ් සෙල්ලම් කරමින් හිටිය | → | Were they playing cards ?<br>ව(ර්) දේ ප්ලේයිං කාඩ්ස් ?<br>ඔවුන් කාඩ් සෙල්ලම් කරමින් හිටියද ? |
| He was watching television<br>හී වෝස් වොචිං ටෙලිවිෂන්<br>ඔහු ටී වී බලමින් හිටිය | → | Was he watching television ?<br>වෝස් හී වොචිං ටෙලිවිෂන් ?<br>ඔහු ටී වී බලමින් හිටියද ? |
| She was cooking in the kitchen<br>ෂී වෝස් කුකිං ඉන් ද කිචන්<br>ඇය කුස්සියේ උයමින් හිටිය | → | Was she cooking in the kitchen ?<br>වෝස් ෂී කුකිං ඉන් ද කිචන් ?<br>ඇය කුස්සියේ උයමින් හිටියද. |

ඒක හරිම ලේසියි . ඉංග්‍රීසි භාෂාවේ බොහෝ වාක්‍යය රටාවන් හරිම සරලයි . ඒවා හරියට ග්‍රහණය කරගෙන මතක තබා ගත්තොත් ඉංග්‍රීසි කියන්නේ ඉතාම ලෙහෙසි සහ ඉතාම සිත්ගන්නා සුළු භාෂාවක් .

තවත් උදාහරණ වශයෙන් එදිනෙදා ජීවිතයේදී අපට නිතර ඇසෙන්නට ලැබෙන මේ ආකාරයේ වාක්‍යය කීපයක් ගනිමු

Were you sleeping ?
ව(ර්) යූ ස්ලීපිං ?
ඔයා නිදියමින්ද හිටියේ ? ( ඔයා නිදාගෙනද හිටියේ ? )

Were they getting late ?
ව(ර්) දේ ගෙටිං ලේට් ?
ඔවුන් ප්‍රමාද වෙමින්ද හිටියෙ ?

Were you waiting for the bus ?
ව(ර්)) යූ වේටිං ෆෝ ද බස් ?
ඔයා බස් එක එනකල් බලාගෙනද හිටියේ ?

Was he trying to cheat you ?
වෝස් හී ට්‍රයිං ටු චීට් යූ ?
ඔහු ඔයාව රවටන්නද උත්සාහ කරමින් හිටියේ ?

Was she cleaning the house all morning?
වෝස් ෂී ක්ලීනිං ද හවුස් ඕල් මෝනින් ?
ඇය උදේ වරුවෙම ගෙදර පිරිසිදු කර කරද හිටියේ ?

Were you studying for the exam last night?
ව(ර්) යූ ස්ටඩීං ෆෝ දි එග්සෑම් ලාස්ට් නයිට් ?
ඔයා ඊයේ රෑ විභාගෙට පාඩම් කර කරද හිටියේ ?

Were you driving to the office at that time?
ව(ර්) යූ ඩ්‍රයිවිං ටු ද ඔෆිස් ඇට් දැට් ටයිම් ?
ඔයා ඒ වෙලාවේ ඔෆිස් එකට වාහනේ එලවන ගමන්ද හිටියේ ?

Were they playing music all night?
ව(ර්) දේ ප්ලේයිං මියුසික් ඕල් නයිට් ?
ඔවුන් මුළු රෑ පුරාම සංගීතය වාදනය කරමින් හිටියද ?

Were you shopping in the town yesterday afternoon?
ව(ර්) යූ ශොපිං ඉන් ද ටවුන් යෙස්ට(ර්)ඩේ ආෆ්ටනූන් ?
ඊයේ හැන්දෑවේ ඔයා ටවුන් එකේ ෂොපින් කර කර හිටියද ?

Were they making a lot of noise ?
ව(ර්) දේ මේකිං අ ලොට් ඔෆ් නොයිස් ?
ඔවුන් ගොඩක් සද්ද කරමින්ද හිටියේ ?

Were you laughing at him?
ව(ර්) යූ ලාෆිං ඇට් හිම් ?
ඕගොල්ලෝ ඔහුට හිනාවෙමින්ද හිටියේ ?

Were they working in the garden in the evening?
ව(ර්) දේ ව(ර්කිං ඉන් ද ගාඩ්න් ඉන් ද ඊව්නිං ?
ඔවුන් සවස ගෙවත්තේ වැඩ කර කරද හිටියේ ?

Were they running to catch the train?
ව(ර්) දේ රනිං ටු කැච් ද ට්‍රේන් ?
ඔවුන් කෝච්චිය අල්ලා ගන්න දුවන ගමන්ද හිටියේ ?

Were you talking to your friend on the phone?
ව(ර්) යූ ටෝකිං ටු යුව(ර්) ෆ්‍රෙන්ඩ් ඔන් ද ෆෝන් ?
ඔයා ෆෝන් එකෙන් යාලුවා එක්ක කතා කර කර හිටියද ?

Were they watching TV in the living room?
ව(ර්) දේ වොචිං ටීවී ඉන් ද ලිවිං රූම් ?
ඔවුන් සාලේ ටීවී බලමින්ද හිටියේ ?

Were they shouting at each other?
ව(ර්) දේ ෂවුටිං ඇට් ඊච් අද(ර්) ?
ඔවුන් එකිනෙකාට කෑ ගසමින්ද හිටියේ ?

Was she watering the plants in the garden?
වෝස් ෂී වෝටරිං ද ප්ලාන්ට්ස් ඉන් ද ගාඩ්න් ?
ඇය ගෙවත්තේ පැල වලට වතුර දමමින්ද හිටියේ ?

Were you using my phone?
ව(ර්) යූ යූසිං මයි ෆෝන් ?
ඔයා මගේ ෆෝන් එක පාවිච්චි කරකරද හිටියේ ?

Were they having dinner at that time?
ව(ර්) දේ හැවිං ඩින(ර්) ඇට් දැට් ටයිම් ?
ඔවුන් ඒ වෙලාවේ රාත්‍රී ආහාරය ගනිමින්ද හිටියේ ?

මීලගට නිතර ඇසෙන , බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකි වාක්‍යයක් ගමු .
ඔයා මොනවද කර කර හිටියේ ? එයත් මේ ව්‍යාකරණ රටාවටම සෑදෙන වාක්‍යයක් . නමුත් මොකක්ද (what) කියන ප්‍රශ්න වචනේ එතනට එකතු වෙනවා

What were you doing ?
වට් වර්) යූ ඩුයිං ?
ඔයා මොනවද කර කර හිටියේ ?

ඉදිරියේදී අපි ප්‍රශ්න වචන ගැන ඉගෙන ගන්නවා. එවිට අපි මේ ඉගෙන ගන්න විවිධ ක්‍රියා අවස්ථා වල ප්‍රශ්න ස්වරූපයට ප්‍රශ්න වචනත් එකතු කරලා තවත් සංකීර්ණ ප්‍රශ්න සාදන්න පුළුවන් වේවි

හොදයි , දැන් “කරමින් සිටියා “ , “කරමින් සිටියේ නැහැ “ , “ කරමින්ද සිටියේ ?” කියන ආකාර තුනම ඔබට පුළුවන් . දැන් අභ්‍යාසය කිරීමේ අවස්තාව . ක්‍රියා පදයේ ing රූපය දී තිබෙනවා. වාක්‍යයේ අනෙකුත් වචනත් මාරු කර දී තිබෙනවා. ඔබට තිබෙන්නේ සිංහල තේරුම දෙස බලා වාක්‍යයට යෙදිය යුත්තේ was ද were ද යන්න තීරණය කර නිවැරදිව වාක්‍යය ගලපා ලිවීම . ඉන් පසු ඒ සියලු වාක්‍යය ඒවායේ නැතර්තයට සහ ප්‍රශ්නාර්ථයට හැරවිය යුතුයි . නිතරම වාක්‍යයේ මුල් අකුර කැපිටල් අකුරකින් පටන් ගන්න අමතක කරන්න එපා

Ex 15

Part 1 - Was හෝ were යොදා නිවැරදිව වචන ගලපා වාක්‍යය ගොඩ නගන්න

1. මම ඊයේ සැන්දෑවෙ කතා පොතක් කියවමින් හිටියේ.
   reading, yesterday, evening, a story book, I

02. ඔහු ඒ වෙලාවේ ඔහුගේ කා(ර්) එක අලුත්වෙලා කරමින් හිටියෙ

   repairing, he, his car ,at that time.

03. අපි අපේ යාළුවාට ලිපියක් ලියමින් හිටියේ.

   friend , writing, our , a letter, to, we

04. ළමයි වේදිකාවේ නටමින් හිටියෙ.

dancing , the children ,on the stage.

05.ඇය අම්මාව එක්ක කතා කරමින් හිටියෙ

talking , she ,with , her mother.

06.පිරිමි ළමයි ගඟේ පීනමින් හිටියෙ.

swimming , in the river , the boys

07.ඇය සාදයේදී රතු ඇඳුමක් ඇඳගෙන හිටියෙ.

wearing , at the party , she , a , red dress

08. ඔවුන් ඊයේ රෑ පාටියේ ඩාන්ස් කරමින් හිටියේ

dancing , at the party , last night , they

09.ඔවුන් ඊයේ වාර පරීක්ෂණය සදහා පාඩම් කරමින් හිටියෙ.

they ,for , studying, the, term test ,yesterday.

10. ඔයා මාර්ගයෙ ඉතා වේගයෙන් වාහනේ එලවමින් හිටියෙ.

driving,you , on the road , too fast

Part 2- ඉහත වාක්‍යය සියල්ල නැතර්තයට හරවා ලියන්න

Part 3 - ඉහත වාක්‍යය සියල්ල ප්‍රශ්නාර්ථයට හරවා ලියන්න

Lesson 31 **Spoken English**

අපි මොනවා හරි කරමු කියල යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන කොට , ඒ කියන්නේ ,අපි යමු , අපි කමු , අපි විවේක ගමු , ඒ වගේ අදහසක් ඉදිරිපත් කරන කොට ,ඒක ඉංග්‍රීසියෙන් කියන විධිය තමයි අපි මෙහිදී ඉගෙන ගන්නේ . අපි යම් දෙයක් කරමු කියන අදහස ඉංග්‍රීසියෙන් කියන්න පාවිච්චි කරන විශේෂ යෙදුමක් තමයි Let ‘s - ලෙට්ස් . එය Let us -ලෙට් අස් කියන වචන දෙක කෙටි කරලා හැදුනු වචනයක් . දැන් අපි බලමු විවධ උදාහරණ

Let’s go
ලෙට්ස් ගෝ
අපි යමු

Let's eat something
ලෙට්ස් ඊට් සම්තින්
අපි මොනවා හරි කමු

Let’s drink something
ලෙට්ස් ඩ්‍රින්ක් සම්තිං
අපි මොනවා හරි බොමු

Let’s do something
ලෙට්ස් ඩු සම්තින්
අපි මොනවා හරි කරමු

Let’s watch a movie
ලෙට්ස් වොච් අ මූවී
අපි චිත්‍රපටියක් බලමු

Let’s take a rest
ලෙට්ස් ටේක් අ රෙස්ට්
අපි විවේකයක් ගනිමු

Let’s have a look
ලෙට්ස් හැව් අ ලුක්
අපි පොඩ්ඩක් බලමු (යම් දෙයක් පරික්ෂා කර බලමු )

Let’s wait
ලෙට්ස් වේට්
අපි බලන් ඉමු (රැඳී ඉමු )

Let’s ask the teacher
ලෙට්ස් ආස්ක් ද ටීච(ර්)
අපි ටිච(ර්)ගෙන් අහමු

Let’s give it a try
ලෙට්ස් ගිව් ඉට් අ ට්‍රයි
අපි ඒකට උත්සාහයක් කරමු

Let’s start now
ලෙට්ස් ස්ටාට් නව්
අපි දැන් පටන් ගනිමු

Let’s finish now
ලෙට්ස් ෆිනිෂ් නව්
අපි දැන් ඉවර කරමු

Let’s plan a trip
ලෙට්ස් ප්ලෑන් අ ට්‍රිප්
අපි ට්‍රිප් එකක් ප්ලෑන් කරමු

Let’s play a game
ලෙට්ස් ප්ලේ අ ගේම්
අපි සෙල්ලමක් කරමු

Let’s have a party
ලෙට්ස් හැව් අ පාටි
අපි පාටියක් දාමු

Let’s make something to eat
ලෙට්ස් මේක් සම්තින් ටු ඊට්
අපි කන්න මොනවා හරි හදමු

ඉතාම සරල රටාවක් . දැන් ඔබ උත්සාහ කරන්න එවැනි වාක්‍යය 10ක් තනන්න . එදිනෙදා ජීවිතයේදී පාවිච්චි වෙන ,සරල , අර්ථාන්විත වාක්‍යය 10ක් සාදන්න උත්සාහ කරන්න . ඔබට උදව්වක් වශයෙන් එවැනි වාක්‍යය 5ක් අපි යෝජනා කරන්නම්. තවත් 5ක් ඔබම සාදාගන්න. මේ වාක්‍යය පහ ගොඩනගන්න අවශ්‍ය සියලුම වචන මේ වෙනකොට ඔබ දන්නවා. උත්සාහ කරලා බලන්න

1. අපි ආපහු ඒක කරමු
2. අපි එහෙ යමු

3. අපි මොනවා හරි උයමු
4. අපි ඇයට  උදව් කරමු
5. අපි කාමරේ පිරිසිදු කරමු

**Vocabulary  31**

Afternoon - ආෆ්ට(ර්)නූන් - හවස් වරුව

Learn by heart - ල(ර්)න් බයි හා(ර්)ට් - කටපාඩම් කරනවා

Evening - ඊව්නින් - හැන්දෑ වරුව (හවස 5න් පසු)

catch - කැච් - අල්ලාගන්නවා

office - ඔෆිස් - කාර්යාලය

stage - ස්ටේජ් - වේදිකාව

term test - ට(ර්)ම් ටෙස්ට් - වාර විභාගය

River - රිව(ර්) - ගඟ

Lake - ලේක් - විල

Ocean - ඕෂන් - සාගරය

Beach - බීච් - වෙරළ

Sand - සෑන්ඩ් - වැලි

Stone - ස්ටෝන් - ගල

Rock - රොක් - පර්වතය

Mountain - මවුන්ටන් - කන්ද

Valley - වැලී - නිම්නය

Forest - ෆොරස්ට් - වනය

Jungle - ජංගල් - කැලය

Island - අයිලන්ඩ් - දූපත

Field - ෆීල්ඩ් - කුඹුර , ගොවි බිම

Farm - ෆාම් - ගොවිපොළ

Farmer - ෆාම(ර්) - ගොවියා